THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 2 - Issue I
October-November 2024

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# A study on how the vocabulary of the Sinhala language was nourished by the terms related to Corona epidemic

**V. Piyumi Dinushika Vidyarathna**

ARTICLE DETAILS

Published Online & Printed
October-November 2024

*Author:*

**V. Piyumi Dinushika Vidyarathna**
***Final Year Student***
University of Peradiniya Sri Lanka
Email:*vidyarathnapiyumi@gmail.com*

**Keywords:**
Corona epidemic, Sinhala language, vocabulary, nourished, usage

## Abstract

The social and cultural events that took place in the country in each era led to the development of the vocabulary of the Sinhala language. In recent times, the major event that has affected the development of Sinhala vocabulary is the global epidemic situation called 'Corona'. The lack of vocabulary needed to identify the epidemic and its concepts and describe the processes to control the spread of the epidemic saw the creation of new terms in the Sinhala language, the addition of words form other languages to the Sinhala language and it can be seen how some words in the Sinhala language were used more during the epidemic. The research problem of this study is what words have been added to the Sinhala language due to the corona epidemic and how the vocabulary of the Sinhala language has been nourished by the words added due to the Corona epidemic. Collected data from magazines, newspapers, documents and internet articles published on the Corona pandemic. It is studied how words related to the corona epidemic were combined with Sinhala language words and how the Sinhala vocabulary was nourished. When asking how words related to the corona epidemic have been added to the Sinhala language according to the etymology of those words, it was seen how the English equivalent of the root words is used or not, how a Sinhala word related to the root word is used or not. It can also how the words added to the Sinhala language with the corona epidemic are used as inflection and as synonyms.

## හැඳින්වීම

සිංහල භාෂාව ආරම්භ වූ දා සිට එහි විකාසය සිදු වී ඇති ආකාරය දෙස බැලීමේදී විවිධ යුගවලදී විවිධ භාෂාවන්ගේ බලපෑම සිදු වී ඇති බව පෙනේ මේ ආකාරයෙන් සිංහල භාෂාවේ වාක්කෝෂය පුළුල් වීමෙහිලා වෙනත් භාෂාවන්ගේ වචන එක් වීමට බලපානු ලබන්නේ විවිධ යුගයන්හිදී ඇති වූ සමාජ සිදුවීම්යි සමීප කාලීනව සිංහල භාෂාවේ වාක්කෝෂය පෝෂණය වීමෙහිලා දැඩි බලපෑමක් ඇති වූ ආසන්නතම සිදුවීම වන්නේ 'කොරෝනා' නම් ගෝලීය වසංගත තත්ත්වයයි. එහිදී වසංගතය හඳුනා ගැනීමට, එහි සංකල්ප හඳුනා ගැනීමට, වසංගත ව්‍යාප්තිය වැලැක්වීමට සහ මර්දනය කිරීමේ ක්‍රියාවලීන් විස්තර කරගැනීමට අවශ්‍ය වාංමාලාවක් නොතිබීම හේතුවෙන් කොරෝනා වසංගතය හා සම්බන්ධ ක්‍රියාවලී හඳුන්වා ගැනීම සඳහා සිංහල භාෂාවෙන් නව පද නිර්මාණකරණය,වෙනත් භාෂාවන්හි ව්‍යවහාර කෙරෙන පද සිංහල භාෂාවට එකතු කර ගැනීම දැකගත හැකි විය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ කොරෝනා වසංගතයත් සමඟ සිංහල භාෂාවට එකතු වූ වචනවලින් සිංහල වාක්කෝෂය පෝෂණය වී ඇත්තේ කෙසේද යන්න අධ්‍යයනය කර බැලීමයි. පර්යේෂණ ගැටලු වන්නේ කොරෝනා වසංගතය ආශ්‍රයයෙන් සිංහල වාක්කෝෂයට එක් වූ වචන මොනවාද යන්න සහ කොරෝනා වසංගතය ආශ්‍රයයෙන් පෝෂිත වාක්කෝෂය සිංහලයේ ව්‍යවහාර වන්නේ කෙසේද යන්නයි. කොවිඩ් වසංගතයෙන් මෙරටට බලපෑම් ඇති වූ දින සිට ප්‍රවෘත්ති, පුවත්පත්, සඟරා සහ ලිපි ලේඛනවල වෛරසය පිළිබඳ විවිධ තොරතුරු පළ විය. මෙහිදී සිංහල මාධ්‍යයෙන් අන්තර්ජාලයේ කොරෝනා වසංගතය සම්බන්ධයෙන් පළ වූ ලිප, වාර්තා, පර්යේෂණ සහ පුවත්පත් ඇසුරින් වචන එකතු කර ගනු ලැබේ. ඊට අමතරව කොරෝනා වසංගතය සමඟ ඉංග්‍රීසි භාෂාවට එක් වූ නව වචන පිළිබඳව අන්තර්ජාලයේ පළ වී ඇති වාර්තා අධ්‍යයනය කරමින් එම වචන සඳහා සිංහල භාෂාවෙන් යෙදී ඇති වචන ඇසුරින්ද වචන එකතු කරගනු ලැබේ. දත්ත එක්රැස් කර ගැනීමෙන් අනතුරුව සිංහල භාෂාවට එක් වූ නව පද ඉංග්‍රීසි තත්සම පද වසයෙන් සිංහල භාෂාවට එකතු වී ඇති ආකාරය, ඉංග්‍රීසි පදය වෙනුවට සිංහල භාෂාවේ පද භාවිත කෙරෙන ආකාරය ආදි වසයෙන් නෛරුක්තික විග්‍රහයක් කරනු ලැබේ එහිදී එම වචන විශේෂණ පූර්ව පද වසයෙන් සහ විශේෂණ අපර පද වසයෙන් යෙදෙන ආකාරය සහ විභක්ති පද වසයෙන් වරනැගෙමින් ව්‍යවහාර වන ආකාරය පිළිබඳ ව්‍යවහාරාත්මක විග්‍රහයක්ද මෙහිදී සිදු කරනු ලැබේ මෙම විග්‍රහයන් ඇසුරින් කොරෝනා වසංගතය ආශ්‍රිත පදවලින් සිංහල භාෂාවේ වාක්කෝෂය පෝෂණය වී ඇති ආකාරය පිළිබඳව මෙහිදී අධ්‍යයනය කෙරේ.

## අන්තර්ගතය

### නෛරුක්තික සහ අර්ථ විග්‍රහය

නෛරුක්තික විග්‍රහය සහ අර්ථ විග්‍රහය යනුවෙන් මෙහිදී අදහස් කෙරෙන්නේ කොරෝනා වසංගත ආශ්‍රිතව සිංහල භාෂාවට එකතු වූ වචන ඒවායෙහි නිරුක්තිය අනුව විමසා බැලීම සහ එහි වචනාර්ථය විමසා බැලීමය.

| මූල වචනය | ඉංග්‍රීසි තත්සම පදය | සිංහලයේ භාවිත වචනය |
|---|---|---|
| Antigen | ඇන්ටිජන් | ★ |
| Astrazeneca | ඇස්ට්‍රාසනිකා | ★ |
| Booster | බූස්ටර් | වර්ධක |
| Corona | කොරෝනා | ★ |
| Covid -19 | කොවිඩ්-19 | ★ |
| Delta | ඩෙල්ටා | ★ |
| Global pandemic | ★ | ගෝලීය වසංගතය |
| Lockdown | ලොක්ඩවුන් | අගුළු දැමීමං වසාතැබීම |
| Moderna | මොඩර්නා | ★ |
| Movement Restriction | ★ | සංචරණ සීමා |
| Omicron | ඔමික්‍රෝන් | ★ |
| One meter distance | ★ | මීටරයක පරතරය |
| Online | ඔන්ලයින් | මාර්ගගත |
| Pandemic | පැන්ඩමික් | වසංගතය |
| PCR | පීසීආර් | ★ |
| Pfizer | ෆයිසර් | ★ |
| Quarantine | කොරොන්ටීන් | නිරෝධායනය |
| Self Isolate | ★ | ස්වයං හුදකලා වීම |
| Sinopharm | සයිනෝෆාම් | ★ |
| Social Distance | සෝෂල් ඩිස්ටන්ස් | සමාජ දූරස්ථභාවය |

වගු අංක 1:

කොරෝනා වසංගත ආශ්‍රිතව සිංහල භාෂාවට එකතු වූ වචන ඒවායෙහි නිරුක්තිය අනුව මෙහි දැක්වේ. මෙහි මූල වචනයට අදාළ ඉංග්‍රීසි තත්සම වචනයක් හෝ සිංහල පදයක් හෝ භාවිතයේ නොමැති නම් ඒ බව හැඟවීම සඳහා ★ සලකුණ යොදා ගෙන ඇත.

Antigen - ඇන්ටිජන් - ⋆

කොරෝනා වෛරසය හඳුනා ගැනීම සඳහා සිදු කෙරන එක් පරීක්ෂණ ක්‍රමයක් හැඳින්වීම සඳහා මෙම නාමය භාවිත කෙරේ මෙහි නිරුක්තිය ප්‍රංශ භාෂාවට අයත් වන අතර ඉංග්‍රීසි භාෂාව හරහා සිංහල භාෂාවට පැමිණි වචනයකි (Harper, 2022) 'ඇන්ටිජන්' යනු සංඥා නාමයක් වන බැවින් ඒ සඳහා සිංහල භාෂාවෙන් නව වචනයක් නිර්මාණය කරගෙන නොමැති අතර ඉංග්‍රීසි පදයම තත්සම පදයක් වසයෙන් භාවිත කෙරේ.

Astrazeneca - ඇස්ට්‍රාසනිකා -⋆

ඇස්ට්‍රාසනිකා යනු ඇස්ට්‍රාසනිකා නම් බ්‍රිතාන්‍ය සහ ස්වීඩන් බහුජාතික සමාගමකින් කොරෝනා වෛරසය සඳහා නිෂ්පාදනය කරන ලද එන්නතකි. සමාගම් නාමය අනුව මෙම එන්නත නම් කොට ඇත. ඒ අනුව ඇස්ට්‍රාසනිකා යනු එන්නත හඳුන්වන සංඥා නාමයක් වන බැවින් එම නාම පදය සිංහල භාෂාවේ ඉංග්‍රීසි තත්සම පදයක් වසයෙන් භාවිත කෙරේ.

Booster - බූස්ටර් - වර්ධක

ඇමරිකානු ඉංග්‍රීසි භාෂාවෙන් තල්ලු කරීම හෝ එසවීම යන අර්ථයෙන් මුල් වරට භාවිත කළ වචනයකි (Potter, 2020). කොරෝනා වෛරසය සඳහා පළමු මාත්‍රා දෙක ලබා දීමෙන් පසු ලබා දෙන එන්නතකි. ප්‍රතිශක්තිකරණය වර්ධනය කිරීම අරමුණ වේ. මෙරටට වසංගතය පැමිණි මුල් කාල සීමාවේදී 'බූස්ටර්' යන පදයම ඉංග්‍රීසි තත්සම ලෙස භාවිත විය (නිදසුන්ඃ බූස්ටර් එන්නත/ බූස්ටර් මාත්‍රාව). එහෙත් පශ්චාත් කාලීනව 'බූස්ටර්' යන නාමය වෙනුවට 'වර්ධක' යන සංස්කෘත තත්සම පදය භාවිත වන ආකාරය දැකගත හැකිය. බූස්ටර් එන්නත ලබා දීමේ අරමුණ ප්‍රතිශක්තිකරණය වර්ධනය කිරීම වන බැවින් ඒ අරමුණ අනුව ඒ සඳහා සිංහල භාෂාවේ පවතින වර්ධක නම් සංස්කෘත වචනය ව්‍යවහාර කරන බව පෙනේ.

Corona / කොරෝනා /⋆

වර්ෂ 2019 අග කාලසීමාවේදී චීනයේ වූහාන් නගරෙන් හඳුනා ගන්නා ලද වෛරසයයි. ඍදරදබ් යන්නෙහි නිරුක්තිය ලතින් භාෂාවට අයත් වන අතර එහි අර්ථය 'මල්වඩම / ඔටුන්න' යන්නයි. වෛරසයේ පවත්නා හැඩය අනුව එයට මෙම ඍදරදබ් යන නාමය ලැබී ඇත (Harper, 2022). වෛරසය හැඳින්වෙන නාමය Corona වන බැවින් සිංහල භාෂාවේද 'කොරෝනා වෛරසය' යනුවෙන්ම ව්‍යවහාර කෙරේ. ඒ අනුව මෙම නාමය ඉංග්‍රීසි භාෂාව හරහා සිංහල භාෂාවට පැමිණි ඉංග්‍රීසි තත්සම පදයකි.

Covid -19 / කොවිඩ් -19 /⋆

කොරෝනා වෛරසය හැඳින්වීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හඳුන්වා දුන් නිල නාමය වේ (World Helth Organization, 2020). මෙහි ඍඩසා යන්න සිංහල

භාෂාවෙන් 'කොවිඩ්' යනුවෙන් ඉංග්‍රීසි තත්සම පදයක් ලෙසින්ම ව්‍යවහාර කෙරෙන අතර 19 යන්න සඳහා සිංහල සංඛ්‍යා වාච්‍ය පදය වන 'දහනවය' යන්න භාවිත කෙරේ. ඒ අනුව සිංහලයේදී 'කොවිඩ් දහනවය යනුවෙන් ව්‍යවහාර කෙරේ.

Delta / ඩෙල්ටා/⋆

ඉන්දියාවෙන් හඳුනා ගන්නා ලද කොරෝනා වෛරසයේ එක් ප්‍රභේදයක් වේ. 'ඩෙල්ටා' යන වචනය කොරෝනා වසංගතය පැමිණීමට පෙර සිට සිංහල භාෂාවේ භාවිත විය. ගංගා මඟින් ගෙන යන අවසාධිත තැන්පත් වීමෙන් නිර්මාණය වන ත්‍රිකෝණාකාර භූ ලක්ෂණයක් හැඳින්වීම සඳහා මෙය භූගෝල විද්‍යාවේදී භාවිත වේ (The Editors of Encyclopaedia Britannica, 2022.08.24). ග්‍රීක භාෂාවට අයත් වචනයක් වන මෙයින් ත්‍රිකෝණ හැඩය යන අර්ථය ගෙන දේ. 2021 වර්ෂයේදී මෙරටට වැඩි වසයෙන් මෙම කොරෝනාවල ඩෙල්ටා ප්‍රභේදයෙන් බලපෑම් ඇති වීමත් සමඟ 'ඩෙල්ටා' යනුවෙන් භාවිත වූ මුල් අර්ථය වෙනුවට වෛරස නාමයක් වසයෙන් මෙය භාවිත වේ. ඒ අනුව ඩෙල්ටා යනු ඉංග්‍රීසි භාෂාවෙන් සිංහලයට පැමිණි තත්සම පදයකි. භූගෝල විද්‍යා ක්ෂේත්‍රයේ පමණක් භාවිත වූ මෙම වචනය සාමාන්‍ය ජනයා කොරෝනා ප්‍රභේදයක සංඥා නාමයක් වසයෙන් භාවිත වන ආකාරය දැකගත හැකිය. සංඥා නාමයක් වන බැවින් මේ සඳහා සිංහල භාෂාවෙන් නිර්මාණය කරගත් වචනයක් නොමැත.

Global pandemic / ⋆/ ගෝලීය වසංගතය

වූහාන් නගරයෙන් වෛරසය හඳුනාගනු ලැබුවද ඉතා කෙටි කාලයක් ඇතුළත වෛරසය ආසාධිත පුද්ගලයන් ලොව සෑම ප්‍රදේශයකින්ම හඳුනා ගැනීමත් සමඟ එය ගෝලීය වසංගත තත්ත්වයක් වසයෙන් සැලකිණි. සිංහල භාෂාවේදී 'වසංගතය' යන වචනය සහ 'ගෝලීය' යන වචනය වෙන වෙනම භාවිත වීම දැකගත හැකි වේ. මේ වචන දෙක සමාස වසයෙන් එකතු වී ව්‍යවහාර වීම ආරම්භ වූයේ කොරෝනා වසංගතයත් සමඟය. එය ඉංග්‍රීසි භාෂාවේ Global + pandemic යන වචන ද්වයයෙහි සිංහල වචනාර්ථ වන ගෝලීය වසංගතය යන්න ව්‍යවහාර වේ.

Lockdown / ලොක්ඩවුන්/අගුළු දැමීම

කොරෝනා වසංගතය පැමිණීමට පෙර සිංහල භාෂාවේදී 'අගුළු දැමීම' යන වචනය භාවිත වූයේ දොර අගුළු දැමීම, අල්මාරිය අගුළු දැමීම ආදි අවස්ථා සඳහාය. එහිදී අගුළු දැමීම යනුවෙන් ව්‍යවහාර වූයේ 'යම්කිසි දෙයක් විවෘත කිරීමට නොහැකි වන පරිදි වසා දැමීම' යන අර්ථයෙනි. වර්තමානයේදී යම්කිසි ප්‍රදේශයක හෝ රටක ජීවත් වන මිනිසුන්ට ගමනාගමනය, දෛනික වෘත්තීන් සිදු කර ගැනීම වැනි ක්‍රියාකාරකම් කිරීමට නොහැකි වන පරිදි සියලු කටයුතු නවතා තැබීම හැඳින්වීම සඳහා අගුළු දැමීම යන වචනය භාවිත කෙරේ. එය ඉංග්‍රීසි භාෂාවේ Lockdown hk jpkfhys Lock + down යන වචන ද්වයයෙහි සිංහල අර්ථ වන අගුළු + දැමීම යන වචන එකතු කොට ගෙන නිර්මාණය කරගෙන ඇත..

Moderna / මොඩර්නා / ⋆

කොරෝනා වෛරසය සඳහා ඇමරිකාවේ Moderna, Inc. නම් සමාගමෙන් නිෂ්පාදනය කළ එන්නත් නාමයකි (No author, 2022.08.24). මොඩර්නා යන සංඥා නාමය ඉංග්‍රීසි තත්සම පදයක් වසයෙන් සිංහල භාෂාවේ ව්‍යවහාර වේ.

Movement Restriction/ ³/සංචරණ සීමා

කොරෝනා වසංගතයත් සමඟ ජනයා ගැවසීම අවම කිරීම සඳහා පැනවූ නීතියක් වසයෙන් ව්‍යවහාර වේ. Movement + Restriction යන්නෙහි සිංහල වචනාර්ථය වන්නේ චලනය සීමා කිරීම යන්නයි. එහිදී 'චරණය' යන තත්සම පදයට 'සං' යන උපසර්ගය එක් කොට ' යන වචනය නිර්මාණය කරගෙන ඇත. 'සංචරණය' යන වචනය සිංහලයේ ව්‍යවහාර වුවද 'සීමා' යන තත්සම පදයත් සමඟ එකට සමාස වී ව්‍යවහාර වන්නේ කොරෝනා වසංගතයත් සමඟය.

Omicron / ඔමික්‍රෝන් /³

කොරෝනා වසංගතයේ එක් ප්‍රභේදයකි. වෛරස ප්‍රභේදයක නාමයක් වන බැවින් ඉංග්‍රීසි තත්සම පදයක් වසයෙන් සිංහල භාෂාවට එකතු වී ව්‍යවහාර වේ.

One meter distance / ³/ මීටරයක පරතරය

කොරෝනා වසංගත කාලයේදී සෙනඟ ගැවසෙන ස්ථානවල සිටීමේදී එකිනෙකා අතර මීටරයක පරතරය තබා ගන්නා ලෙස උපදෙස් ලැබේ. ඉංග්‍රීසි භාෂාවේ One meter යන්නෙහි සිංහල අර්ථය වන 'මීටර් එකක' යන්න 'මීටරයක' වසයෙන්ද ාසිඒබජැ යන්නෙහි සිංහල අර්ථය වන 'දුර' යන්න වෙනුවට 'පරතරය' යන්න යොදා ගනිමින් නිර්මාණය කරගෙන ඇත.

Online / Tka,hska$ මාර්ගගත

කොරෝනා වසංගතයත් සමඟ වැඩි වසයෙන් ව්‍යවහාර වන වචනයකි. මෙම වචනය වැඩි වසයෙන්ම අධ්‍යාපනය යන වචනයෙහි විශේෂණ පූර්ව සමාස පදයක් වසයෙන් භාවිත වේ. සිංහල භාෂාවේදී ඔන්ලයින් යන වචනය කොරෝනා වසංගතට පෙර සිටම ව්‍යවහාර වූවකි. එනම් ඉංග්‍රීසි තත්සම වචනයක් ලෙසින් සිංහල භාෂාවේ ව්‍යවහාර වූ අවස්ථා දැකගත හැකිය. කොරෝනා වසංගත සමයත් සමඟ මෙම වචනය නිතර භාවිතයට ගැනීම හේතු කොට ගෙන ඒ සඳහා 'මාර්ගගත' යන වචනය නිර්මාණය කොට ගෙන සිංහල වාක්කෝෂයට එකතු කරගෙන ඇත.

Pandemic/ mekavñla/ වසංගතය

වසංගතය යන වචනය සිංහල භාෂාවේ ව්‍යවහාර වුවද වසංගතය යන අර්ථයට සමාන ඉංග්‍රීසි වචනය යන 'පැන්ඩමික්' යන වචනය කොරෝනා වසංගතයත් සමඟ සිංහල භාෂක සමාජයේ ඉංග්‍රීසි තත්සම වචනයක් වශයෙන් ව්‍යවහාර වන ආකාරය දැකගත හැකිය.

PCR / පීසීආර්/³

කොරෝනා වසංගතය ආසාදනය වූවන් හඳුනා ගැනීම සඳහා කෙරන පරීක්ෂණයකි. ඡගඍගසෘ යනු ඉංග්‍රීසි භාෂාවේ Polymerase Chain Reaction යන වචනයෙහි කෙටිකර දැක්වීමකි. මෙය සංඥා නාමයක් වන බැවින් සිංහල භාෂාවේද පීසීආර් යන්න ඉංග්‍රීසි තත්සම පදයක් වසයෙන් සිංහල භාෂාවේ ව්‍යවහාර කෙරේ.

Pfizer/ ෆයිසර් /³

Pfizer Inc. යන ඇමරිකාවේ බහුජාතික ඖෂධ සමාගමක් විසින් කොරෝනා වසංගතය සඳහා නිෂ්පාදනය කරනු ලැබූ එන්නත හැඳින්වෙන නාමය වේ (No author, 2022.09.21). එන්නත හැඳින්වෙන සංඥා නාමයක් වන බැවින් මෙම වචනය සිංහල භාෂාවේ ඉංග්‍රීසි තත්සම වචනයක් වසයෙන් ව්‍යවහාර කෙරේ.

Quarantine / කොරොන්ටීන් /නිරෝධායනය

Quarantine යනු ඉතාලි භාෂාව හරහා ඉංග්‍රීසි භාෂාවට පැමිණි ලතින් වචනයකි. ලතින් භාෂාවෙන් දින හතළිහ යන අර්ථය වන අතර එය ඉතාලි භාෂාව හරහා ඉංග්‍රීසි භාෂාවට පැමිණි විට 'ලෙඩ රෝග පැතිරීම වැලැක්වීම, හුදකලා කිරීම' යන අර්ථය ගෙන දේ. කොරෝනා වසංගතය පැමිණීමත් සමඟ කොරොන්ටීන් / කොරොන්ටයින් යනුවෙන් ඉංග්‍රීසි තත්සම වචනයක් වසයෙන්ද පශ්චාත් කාලීනව 'නිරෝධායනය' යන්න සංස්කෘත තත්සම වචනයක් වසයෙන්ද ව්‍යවහාර කෙරේ (රන්දුල, 2020.03.30).

Self Isolate/ ³/ ස්වයං හුදෙකලා වීම

කොරෝනා වෛරසය වැලඳුණු පුද්ගලයකු අන් අයගෙන් දූරස්ථව තනිව සිටීම 'ස්වයං හුදකලා වීම' නම් වේ. ඉංග්‍රීසි භාෂාවේ Self + Isolate යන වචනවල සිංහල අර්ථ වන සංස්කෘත 'ස්වයං' යන වචනයත් සිංහල 'හුදකලා' යන වචනයත් එකතු කරමින් නිර්මාණය කරගෙන ඇත. 'හුදකලා' යන්න 'පාළුව, තනිකම' යන අර්ථයෙන් භාවිත විය. වසංගතයත් සමඟ වසංගතයෙන් ජනයා ආරක්ෂා කිරීමට ගන්නා පියවරක් සඳහා 'හුදකලා කිරීම' යන්න භාවිත වේ. එසේම වෛරසය ආසාධනය වූවකු අන් අයට රෝගය පැතිරවීමෙන් වැළකී සිටීම සඳහා ආසාධිත පුද්ගලයා ස්වයං හුදකලා කෙරේ. ඒ අනුව 'ස්වයං හුදකලා වීම' යනු කොරෝනා වෛරසයෙන් ආරක්ෂා වී සිටීම සඳහා ගන්නා ආරක්ෂක පියවරක් යන අර්ථය ගෙන දෙමින් සිංහලයේ ව්‍යවහාර වන්නකි.

Sinopharm/ සයිනොෆාම්/⋆

කොරෝනා වෛරසය සඳහා චීන රාජ්‍යයෙන් නිෂ්පාදනය කරන ලද එන්නත Sinopharm වේ. මෙයද සංඥා නාමයක් වන බැවින් සිංහල භාෂාවේදී ඉංග්‍රීසි තත්සම පදයක් වශයෙන් ව්‍යවහාර වේ.

Social Distance / සෝෂල් ඩිස්ටන්ස් / සමාජ දූරස්ථභාවය

සිංහල භාෂාවේදී 'සෝෂල් ඩිස්ටන්ස්' යන ඉංග්‍රීසි තත්සම වචනයද එහි සිංහල වාච්‍යාර්ථය වන 'සමාජ දූරස්ථභාවය' යන්නද ව්‍යාවහාර වන ආකාරය දැකගත හැකි වේ. සමාජ දූරස්ථභාවය යන වචනය භාවිත වූවද එයින් අදහස් වන්නේ සමාජයෙන් ඈත් වී සිටීම නොව, ළඟ සිටින පුද්ගයන්ගෙන් යම් පරතරයක් ඇතිව ඈත්ව සිටීම යන්නයි.

Sputnik / ස්පුට්නික් / ⋆

රුසියානු රාජ්‍යයෙන් කොරෝනා වෛරසය සඳහා නිෂ්පාදනය කරන ලද එන්නතෙහි නාමය වේ. ඒ අනුව සංඥා නාමය ඒ ආකාරයෙන්ම ඉංග්‍රීසි තත්සම වචනයක් ලෙසින් සිංහල භාෂාවේ ව්‍යවහාර කෙරේ.

Working At Home / ⋆ / නිවසේ සිට වැඩ කිරීම

Working At Home යන ඉංග්‍රීසි වචනයේ සිංහල වාච්‍යාර්ථය වන්නේ නිවසේ සිටිමින් නිවසේ වැඩ කටයුතු සිදු කිරීමය. එහෙත් කොරෝනා වසංගත සමයේදී නිවසේ සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ රාජකාරී කටයුතුවල නිරත වීම හැඳින්වීම සඳහා Working At Home යන වචනය ව්‍යවහාර විය.

මේ අනුව කොරෝනා වසංගතය සමඟ ඉංග්‍රිසි භාෂාවේ වචන සිංහල වාක්කෝෂයට ප්‍රමුඛ වසයෙන් එකතු වී ඇති බවත් එම වචන ඉංග්‍රීසි තත්සම වසයෙන් හෝ මුල් වචනයට වෙනත් වචනයක් සිංහලයේ යොදා ගනිමින් හෝ එකතු වී ඇති බව පෙනී යයි.

## ව්‍යවහාරාත්මක විග්‍රහය

ව්‍යවහාරාත්මක විග්‍රහය යනුවෙන් මෙහිදී කෙරෙන්නේ කොරෝනා වසංගතයත් සමඟ සිංහල භාෂාවට එකතු වූ වචන විභක්ති වසයෙන් වරනැගෙමින් සහ සමාස වසයෙන් ව්‍යවහාර වන ආකාරය කෙසේද යන්න විමසා බැලීමය.

| වචනය | සමාස වසයෙන් | | විභක්ති වසයෙන් | |
|---|---|---|---|---|
| | විශේෂණ පූර්ව සමාස වසයෙන් | විශේෂණ අපර සමාස වසයෙන් | තනිපදයක් ලෙස වරනැඟීම | විශේෂණ පදයක් ලෙස යෙදී විශේෂ්‍ය වරනැඟීම |
| ඇන්ටිජන් | ඇන්ටිජන් පරීක්ෂණය<br>ඇන්ටිජන් වාර්තාව | ★ | ★ | ඇන්ටිජන් පරීක්ෂණයට<br>ඇන්ටිජන් පරීක්ෂණයෙන්<br>ඇන්ටිජන් වාර්තාවට<br>ඇන්ටිජන් වාර්තාවෙන් |
| ඇස්ට්‍රාසනිකා | ඇස්ට්‍රාසනිකා එන්නත<br>ඇස්ට්‍රාසනිකා මාත්‍රාව | ★ | ★ | ඇස්ට්‍රාසනිකා එන්නතට<br>ඇස්ට්‍රාසනිකා එන්නතේ<br>ඇස්ට්‍රාසනිකා මාත්‍රාවට<br>ඇස්ට්‍රාසනිකා මාත්‍රාවෙන් |
| බූස්ටර්/වර්ධක | බූස්ටර් එන්නත<br>වර්ධක මාත්‍රාව<br>වර්ධක එන්නත | ★ | ★ | බූස්ටර් එන්නතට<br>බූස්ටර් එන්නතෙන්<br>වර්ධක මාත්‍රාවට<br>වර්ධක මාත්‍රාවේ |
| කොරෝනා | කොරෝනා වෛරසය<br><br>කොරෝනා ආසාදිතයා | වූහාන් කොරෝනා<br>ඉන්දීය කොරෝනා | කොරෝනාවේ<br>කොරෝනාවට<br>කොරෝනා-වෙන් | කොරෝනා වෛරසයට<br>කොරෝනා වෛරසයෙන්<br><br>වූහාන් කොරෝනාවෙන්<br>(විශේෂණ අපර ලෙස යෙදීද වරනැඟේ) |
| කොවිඩ් - 19/ කොවිඩ් | කොවිඩ් 19 වෛරසය<br>කොවිඩ් මාරයා<br>කොවිඩ් රෝහල | ★ | කොවිඩ්වල<br>කොවිඩ්වලට<br>කොවිඩ්වලින් | කොවිඩ් 19 වෛරසයට<br>කොවිඩ් 19 වෛරසයෙන්<br>කොවිඩ් 19 වෛරසයේ |
| ඩෙල්ටා | ඩෙල්ටා ප්‍රභේදය<br>ඩෙල්ටා වෛරසයට | ★ | ඩෙල්ටාවට<br>ඩෙල්ටාවෙන් | ඩෙල්ටා ප්‍රභේදයට<br>ඩෙල්ටා ප්‍රභේදයෙන්<br>ඩෙල්ටා වෛරසයට<br>ඩෙල්ටා වෛරසයේ |
| ගෝලීය වසංගතය | ★ | ★ | ගෝලීය වසංගතයට<br>ගෝලීය වසංගතයේ | ★ |
| මොඩර්නා | මොඩර්නා එන්නත | ★ | ★ | මොඩර්නා එන්නතට<br>මොඩර්නා එන්නතේ<br>මොඩර්නා එන්නතෙන් |
| ඔමික්‍රොන් | ඔමික්‍රෝන් ප්‍රභේදය | ★ | ★ | ඔමික්‍රෝන් ප්‍රභේදයට<br>ඔමික්‍රොන් ප්‍රභේදයෙන් |
| ඔන්ලයින්/ මාර්ගගත | ඔන්ලයින් දේශනය<br>මාර්ගගත අධ්‍යා-පනය | ★ | ★ | ඔන්ලයින් දේශනයෙන්<br>මාර්ගගත අධ්‍යාපනයට |

| | | | | |
|---|---|---|---|---|
| පැන්ඩමික් | පැන්ඩමික් එක | ★ | ★ | පැන්ඩමික් එකට<br>පැන්ඩමික් එකෙන්<br>පැන්ඩමික් එකේ |
| පීසීආර් | පීසීආර් පරී-<br>ක්ෂණය<br>පීසීආර් එක | ★ | ★ | පීසීආර් පරීක්ෂණයට<br>පීසීආර් එකෙන් |
| ෆයිසර් | ෆයිසර් එන්නත<br>ෆයිසර් මාත්‍රාව | ★ | ★ | ෆයිසර් එන්නතට<br>ෆයිසර් එන්නතේ<br>ෆයිසර් මාත්‍රාවට |
| සයිනොෆාම් | සයිනොෆාම්<br>එන්නත<br>සයිනොෆාම්<br>මාත්‍රාව | ★ | ★ | සයිනොෆාම් එන්නතට<br>සයිනොෆාම් එන්නතේ<br>සයිනොෆාම් මාත්‍රාවට |
| සෝෂල් ඩිස්ට-<br>න්ස්/ සමාජ<br>දූරස්ථභාවය | සෝෂල් ඩිස්ට-<br>න්ස් එක්/★ | ★ | ★<br>සමාජ<br>දූරස්ථභාවයට<br>සමාජ රස්ථ<br>භාවයෙන් | සෝෂල් ඩිස්ටන්ස් එකට<br>සෝෂල් ඩිස්ටන්ස් එකෙන් |
| ස්පුට්නික් | ස්පුට්නික්<br>එන්නත<br>ස්පුට්නික්<br>මාත්‍රාව | ★ | ★ | ස්පුට්නික් එන්නතට<br>ස්පුට්නික් මාත්‍රාවට |
| සංචරණ සීමා | ★ | ★ | සංචරණ<br>සීමාවට<br>සංචරණ<br>සීමාවේ<br>සංචරණ<br>සීමාවෙන් | ★ |
| මීටරයක<br>පරතරය | ★ | ★ | මීටරයක<br>පරතරයට<br>මීටරයක<br>පරතරයේ | ★ |
| නිරෝධායනය | නිරෝධායන<br>නීති<br>නිරෝධායන<br>කාලය<br>නිරෝධායන<br>නිවාඩු | ගෘහස්ථ<br>නිරෝධා-<br>යනය | නිරෝධාය-<br>නයට<br>නිරෝධායන-<br>යෙන් | ★ |

වගු අංක 02

කොරෝනා වසංගතයත් සමඟ සිංහල භාෂාවට එකතු වූ වචන විභක්ති වසයෙන් වරනැඟෙමින් සහ සමාස වසයෙන් ව්‍යවහාර වන ආකාරය

| වචනය | සමාස වසයෙන් | | ක්‍රියා පද වසයෙන් (සංහත ක්‍රියාඃ නාමයක් සහ ක්‍රියාවක් එකතු වී ක්‍රියා අර්ථයක් ලබා දීම) | විභක්ති වසයෙන් | |
|---|---|---|---|---|---|
| | විශේෂණ පූර්ව පද සමාස | විශේෂණ අපර පද සමාස | | තනිපදයක් වසයෙන් | විශේෂණ පදයක් ලෙස යෙදී එහි විශේෂ්‍ය පදය පමණක් වරනැඟීම |
| ලොක්ඩවුන්/<br>අගුළු දැමීම | ★<br>★ | ★<br>★ | ලොක්ඩවුන් කිරීම<br>අගුළු දැමීම | ★<br>අගුළු දැමීමට අගුළු දැමීමෙන් | ලොක්ඩවුන් කිරීමට ලොක්ඩවුන් කිරීමෙන්<br>★ |
| කොරොන්ටයින්<br>නිරෝධායනය | ★<br>නිරෝධායන නීති නිරෝධායන නිවාඩු | ★<br>ගෘහස්ථ නිරෝධායනය ස්වයං නිරෝධායනය | කොරොන්ටයින් වීම කොරොන්ටයින් කිරීම<br>නිරෝධායනය කිරීම නිරෝධායනය වීම | කොරොන්ටයින් කිරීමට කොරොන්ටයින් කිරීමෙන්<br>නිරෝධායනයට නිරෝධායනයෙන් | ★<br>නිරෝධායන නීතියට නිරෝධායන නීතියේ |

වගු අංක 03

කොරෝනා වසංගතයත් සමඟ සිංහල භාෂාවට එකතු වූ වචන විභක්ති වසයෙන් වරනැඟෙමින් සංහත ක්‍රියා ලෙස යෙදෙමින් සහ සමාස වසයෙන් ව්‍යවහාර වන ආකාරය

මේ අනුව කොරෝනා වසංගතය සමඟ සිංහල භාෂාවට එකතු වූ වචන විභක්ති වසයෙන් වරනැගෙමින් සහ සමාස වසයෙන් යෙදී මෙන්ම සංහත ක්‍රියා වසයෙන්ද යෙදී සිංහල භාෂක සමාජයේ ව්‍යවහාර වන බවත් එබැවින් මෙම වචන එකතු වීමෙන් සිංහල වාක්කෝෂය පෝෂණය වී ඇති බවත් පෙනී යයි.

## සමාලෝචනය

මෑත කාලීනව සිංහල භාෂාවේ වාක්කෝෂය පෝෂණය වීම සඳහා බලපෑ ප්‍රධාන හේතුව ලෙස කොරෝනා වසංගතය හඳුන්වා දිය හැකිය. වසංගතය පැමිණීමත් සමඟ ඒ හා පවත්නා සංකල්ප දැක්වීම, වසංගත තත්ත්වය පාලනය කිරීම, ප්‍රතිකාර ලබා දීමේ ක්‍රම හඳුන්වා දීම සහ වසංගතය මර්දනය කිරීම යනාදි ක්‍රියාවලීන් හැඳින්වීමේදී ඒ සඳහා සිංහල වාක්කෝෂයේ පවත්නා වචන ප්‍රමාණවත් නොවන විට ඉංග්‍රීසි භාෂාවෙන් කොරෝනා වසංගත තත්ත්වය සඳහා ව්‍යවහාර කරන වචන සිංහල වාක්කෝෂය සඳහා එකතු කර ගැනීම සිදු කර ගෙන ඇති බව පෙනේ. ඒ අනුව කොරෝනා වසංගතයත් සමඟ සිංහල වාක්කෝෂයට වැඩි වසයෙන් ඉංග්‍රීසි භාෂාවේ ආභාසය ලැබී ඇති බව මෙහිදී පෙනී යයි. මෙසේ සිංහල වාක්කෝෂයට ඉංග්‍රීසි භාෂාවෙන් එකතු වූ වචන කිසිදු වෙනස්කමකට ලක් නොවී ඒ ආකාරයෙන්ම යෙදෙන ආකාරය දැකගත හැකිය. එසේම සිංහල භාෂාවේ වාක්කෝෂයට එකතු වූ පද විභක්ති අනුව වරනැගෙමින් සිංහල භාෂක සමාජයේ භාවිත වන ආකාරයද පෙනේ. මීට අමතරව සමාස වසයෙන් එනම් විශේෂණ පූර්ව පද සමාස සහ විශේෂණ අපර පද සමාස වසයෙන්ද භාවිත කෙරෙන බව දැකගත හැකි වේ. ඒ අනුව කොරෝනා වසංගතයත් සමඟ සිංහල භාෂාවට එකතු වූ පද මඟින් සිංහල භාෂාව පෝෂණය වූ ආකාරය හඳුනා ගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

රන්දුල, ක. ක. ගනුෂ්ක. (2020.03.30). ''හතළිස් දොහේ අඩස්සිය'', **දිවයින**

විපුල හිමි, ගිනිකටුවැවේ, (2017). **තත්සම වචන සහ තද්භව වචන සහ අනුරූප වචන භාවිතය,** සිත්මිණි ජාත්‍යන්තර ප්‍රකාශකයෝ.

Abdulrahman, Trynti R. Ersyalia Nabila, (2021.11.07). *An analysis of new English words created during Covid-19,* English: Journal of Language, Education and Humanities. www.https://doi.org.

Bharati, Padam Lal. (2020 November). *COVID-19 Neologism in English.* The saptagandaki Journal, vol ·**µ**.

Harper, Douglas. (2022). *Etymologhy, Origin and meaning of Antigen.* www.etymonline.com.

Harper, Douglas. (2022). *Etymologhy, Origin and meaning of Corona*. www.etymonline.com.

No author, (2022.08.24). *Overview of Covid-19 Vaccines*. www.cdc.gov.

No author, (2022.09.21). *Pfizer – BioNTech COVID-19 Vaccines*. www.fda.gov.

Potter, Liz. (3 years ago). *Definitions of booster*. www.macmillandictionaryblog.com.

SALMAN, Saleh AL. Ahamad S. HAIDER, (2021.01.25). *COVID-19 trending neologism and word formation processes in English***.** Russian Journal of Linguistics. www.researchgate.net.

The Editors of Encyclopaedia Britannica. (2022.08.24). *Delta*. www.britannica.com.

World Helth Organization, (2020). *Coronavirus disease*. www.who.int.